**අධ්‍යාපන අමාත්‍යාංශය**
**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය, 2018 දෙසැම්බර්**

උපකාරක ප්‍රශ්න පත්‍රය

**බුද්ධ ධර්මය i,ii** | **කාලය පැය තුනයි**

# බුද්ධ ධර්මය i

**සැලකිය යුතු යි**

(1) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(2) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(3) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක්එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සසැඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
(4) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. තිදොරින් සිදුවන අකුසල කර්ම අතරින් කාය කම්ම කොටසට අයත් **නොවන** කරුණ වන්නේ,
1. ප්‍රාණඝාතය යි. 3. අදත්තාදානය යි
2. ව්‍යාපාදය යි. 4. කාම මිථ්‍යාචාරය යි.

02. ථූපාරාම දාගැබ තැන්පත් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,
1. වාම දළදා වහන්සේ ය. 3. දකුණු අකු ධාතූන් වහන්සේ ය.
2. ලලාට ධාතූන් වහන්සේ ය. 4. ග්‍රීවා ධාතූන් වහන්සේ ය.

03. බුදුරජාණන් වහන්සේගේ **පුරිස දම්ම සාරථී ගුණය** වර්ණනා කරමින් පොළොන්නරු යුගයේ රචිත කෘතියක් වන්නේ,
1. බුත්සරණ යි. 3. ධර්මප්‍රදීපිකාව යි.
2. අමාවතුර යි. 4. සසඳාවත යි.

04. සතර අගතිවලට අයත් **නොවන** කරුණක් වන්නේ,
1. ඡන්දය යි. 3. මෝහය යි.
2. ද්වේශය යි. 4. ලෝභය යි.

05. මාතලේ අළුවිහාරය ධර්ම සංගායනාව සඳහා සහභාගි වූ භික්ෂූන් වහන්සේලා ගණන,
1. පන්සීය කි. 3. හයසීය කි.
2. හත්සීය කි. 4. අටසීය කි.

06. අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාරයට ගන්නා තරමට කෑමට ගිජු වූ තැනැත්තා,
1. අලංසාටක ලෙස හැඳින් වේ. 3. භුත්තවමිතක ලෙස හැඳින් වේ.
2. කාකමාසක ලෙස හැඳින් වේ. 4. ආහාරහත්තක ලෙස හැඳින් වේ.

07. කායානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා යන අනුපස්සනා දියුණු කිරීම,
1. සම්මා සමාධිය නම් වේ. 3. සම්මා සති නම් වේ.
2. සම්මා කම්මන්ත නම් වේ. 4. සම්මා වාචා නම් වේ.

08. **''ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද ? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද ? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ ?''** මෙසේ විමසා සිටියේ,
1. කෝලිත පිරිවැජියා විසින් මුගලන් මහරහතන් වහන්සේගෙන් ය.
2. උපතිස්ස පිරිවැජියා විසින් අස්සජි මහරහතන් වහන්සේගෙන් ය.
3. කෝලිත පිරිවැජියා විසින් වප්ප මහරහතන් වහන්සේගෙන් ය.
4. උපතිස්ස පිරිවැජියා විසින් කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේගෙන් ය.

09. **''බොර ජලයෙහි පැහැදිලි ව කිසිවක් නොපෙනේ ''**මෙම උපමාවෙන් දැක්වෙන නීවරණය වන්නේ,

1. විචිකිච්ඡාව යි.
2. ථීනමිද්ධ යි.
3. ව්‍යාපාදය යි.
4. කාමච්ඡන්දය යි.

10. 12. සිදුහත් කුමරුගේ අග මෙහෙසිය වූ යශෝධරා කුමරියගේ පියා වූයේ,
1. මහානාම රජු ය.
2. සුප්පබුද්ධ රජු ය.
3. අමිතෝදන රජු ය.
4. සුද්ධෝදන රජු ය.

11. චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව ධර්මය පිළිබඳ විමසුමක් **නොකරන්නා,**
1. අල්පේශාක්‍ය ව උපදී.
2. ආබාධ සහිත ව උපදී.
3. ප්‍රඥාව අඩු ව උපදී.
4. විරූපී ව උපදී.

12. **'වේදනා නොමැති වීමෙන් තණ්හාව නැති වේ'** යන අරුත සහිත ප්‍රකාශය පටිච්ච සමුප්පාදයේ දැක්වෙන්නේ,

1. ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ යනුවෙනි.
2. තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ යනුවෙනි.
3. වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ යනුවෙනි.
4. භව නිරෝධා ජාති නිරෝධෝ යනුවෙනි.

13. භික්ෂූන් වහන්සේලාගේ කායික රෝග සඳහා ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි බුදුරජාණන්වහන්සේ විසින් අනුමත කරන ලද්දේ,
1. පෙරහන්කඩය යි.
2. පාත්‍රය යි.
3. සක්මන් මළුව යි.
4. කුඩය යි.

14. බුදුපිළිම නෙළීමේ ඉරියවු අතරින්තිවංක පිළිම ගෙයි හි ඇති බුදුපිළිමයේ ඉරියව්ව වන්නේ.
1. සක්මන් ඉරියව්ව යි.
2. සැතපෙන ඉරියව්ව යි.
3. හිටි ඉරියව්ව යි.
4. හිඳි ඉරියව්ව යි.

15. අප මහා බෝසතාණන් වහන්සේ උපේක්ෂා පාරමිතාව පිරූ ආකාරය දැක්වෙන ජාතක කතාවකි,
1. මහා කපි ජාතකය.
2. ලෝමහංස ජාතකය.
3. වණ්ණුපථ ජාතකය.
4. උම්මග්ග ජාතකය.

16. බුදුරජාණන් වහන්සේ දර සහ ගිනි යන භෞතික වස්තූන් අතර ඇති හේතුඵල සම්බන්ධය දේශනා කළේ ,
1. චක්කවත්ති සීහනාද සූත්‍රය යි.
2. මහා නිදාන සූත්‍රය යි.
3. අග්ගි වච්චගොත්ත සූත්‍රය යි.
4. කාලාම සූත්‍රය යි.

17. පංචශීලයේ සඳහන් කායික,මානසික නිරෝගිතාවය දැක්වෙන ශික්ෂා අතර,
1. පළමුවන හා දෙවන ශික්ෂාපද වැදගත්වේ.
2. දෙවන හා තෙවන ශික්ෂාපද වැදගත් වේ.
3. තෙවන හා සිව්වන ශික්ෂාපද වැදගත් වේ.
4. තෙවන හා පස්වන ශික්ෂාපද වැදගත් වේ.

18. මහනුවර යුගයේ සිතුවම් තුළ ඇති අඛණ්ඩ කථන ක්‍රමය යනු,
1. කොටස් වශයෙන් චිත්‍ර ඇඳීම යි.
2. යම් කතාවක සිදුවීම් අනුපිළිවෙලට චිත්‍රයට නැගීම යි.
3. විවිධ අවස්ථා සිතුවමට නැගීම යි.
4. සුවිශේෂී අවස්ථා පමණක් සිතුවමට නැගීම යි.

19. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත කෘති අතරට අයත් **වන** කෘතිය,
1. කාව්‍යශේඛරය යි.
2. පැරකුම්බා සිරිත යි
3. ගුත්තිල කාව්‍යය යි.
4. දහම්ගැට මාලාව යි.

20. සිත කිලිටි කරන, නිවන් මග අවුරාලන, ක්ලේශ ධර්ම යටපත් කරන භාවනාව කුමක් ද?

1. අසුභ භාවනාව යි.
2. සමථ භාවනාව යි.
3. විදර්ශනා භාවනාව යි.
4. කායගතාසති භාවනාව යි.

21. තෙරුවන් සරණ යෑමෙන් උපාසකයෙකු ආර්ය මාර්ගයට පිළිපන් බව සැලකේ. ඒ අනුව නිති පන්සිල් රකින පුද්ගලයා,

1. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීවයෙන් යුතු අයෙකි.
2. සම්මා වාචා, සම්මා සති,සම්මා ආජීවයෙන් යුතු අයෙකි.
3. සම්මා වාචා,සම්මා ආජීව, සම්මා වායාමයුතු අයෙකි.
4. සම්මා වායාම , සම්මා ආජීව, සම්මා සමාධියෙන් යුතු අයෙකි.

22. බුදු පිළිමයක **ගැටළු විසඳන ආකාරය** නිරූපණය කෙරෙන්නේ

1. අභය මුද්‍රාවෙනි.
2. ධම්ම චක්ක මුද්‍රාවෙනි.
3. ධ්‍යාන මුද්‍රාවෙනි.
4. විතර්ක මුද්‍රාවෙනි.

23. දෙවන ධර්ම සංගායනාව සඳහා අනුග්‍රහය ලබා දුන්නේ,

1. ධර්මාශෝක රජු ය.
2. කාලාශෝක රජු ය.
3. කණිෂ්ක රජු ය.
4. බිම්බිසාර රජු ය.

24. බුදුපිළිම නෙළීමට පෙර, බුදුරුව වෙනුවට වන්දනා කරන ලද පූජනීය වස්තු අතරට අයත් **නොවන්නේ.**

1. බෝධිය යි.
2. පද්මය යි.
3. සිරි පතුළ යි.
4. වජ්‍රය යි.

25. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ධනය විනාශවන ක්‍රම හතරක් දේශනා කරන ලදී. ඒ අතරට අයත් **නොවන්නේ,**

1. රජයට අයිතිවීම යි.
2. ස්වාභාවික විපත්වලට හසුවීම යි.
3. ණයට හිලව් වීම යි.
4. සොරුන් විසින් පැහැර ගැනීම යි.

26. බුදුරජාණන් වහන්සේ විසින් තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් තරුණයාට පුද්ගල විෂමතා පිළිබඳ ව දේශනා කළේ,

1. චූල්ල හත්ථිපදෝපම සූත්‍රය යි.
2. චූල්ල කම්මවිභංග සූත්‍රය යි.
3. තේවිජ්ජ සූත්‍රය යි.
4. අම්බට්ඨ සූත්‍රය යි.

27. මනා වූ පිළිවෙත් පුරන බැවින්, මහා සංඝරත්නය

1. සුපටිපන්න නම් වන සේක.
2. උජු පටිපන්න නම් වන සේක.
3. ඤාය පටිපන්න නම් වන සේක.
4. සාමීචි පටිපන්න නම් වන සේක.

28. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ රෝගී වූ අවස්ථාවක දී උන්වහන්සේට බුදුරජාණන් වහන්සේ විසින් බොජ්ඣංග ධර්මය දේශනා කරන ලද්දේ,

1. කලන්දක නිවාපයේ දී ය.
2. පිප්පලී ගුහාවේ දී ය.
3. ජේතවනාරාමයේ දී ය.
4. මකුල පර්වතයේ දී ය.

29. සිල් ආරක්ෂා කිරීමෙන් ලැබෙන ආනිශංස බොහෝ ය. ඒ අතරට අයත් **නොවන** කරුණකි.

1. කීර්තිය පැතිරීම
2. සිහි මුළා වී කලුරිය කිරීම
3. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම
4. මරණින් මතු සුගතියෙහි ඉපදීම

30. සහජීවනය වර්ධනය කරගැනීමට බුදු දහමේ ඉගැන්වෙන ධර්ම කරුණු තුළ නූතනයට ගළපාගත හැකි හා නූතන සමාජය සුවිශේෂී ව වටහා ගතයුතු කරුණකි **අත්තූපනායික ධර්ම පර්යාය.** එමගින් අදහස් කරනුයේ,

1. තමා උපමා කොට වරදින් මිදීම යි.
2. ධර්මය ගැන සිතා වරදින් මිදීම යි.
3. තමා ගැන සිතා වරදින් මිදීම යි.
4. අනුන් ගැන සිතා වරදින් මිදීම යි.

31. අයහපත කරන්නා යහපත කිරීමෙන් ජයගත යුතු ය. මෙම අදහස සහිත පාලි පාඨය කුමක් ද?

1. අක්කෝධේන ජිනේ කෝධං
2. ජිනේ කදරියං දානේන
3. අසාධුං සාධුනා ජිනේ
4. සච්චේන අලික වාදිනං

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

32. පමණ දන ආහාර නොගැනීම නිසා ඇතිවන ප්‍රතිඵල අතරින් එකකි,
1. නිදුක් බව ඇතිවීම. 3. සුවපහසු පැවැත්ම ඇතිවීම
2. සැහැල්ලු බව ඇතිවීම 4. පහසුවෙන් රෝගාබාධයන්ට ගොදුරු වීම.

33. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ථේරවාදී බුදු සමය හඳුන්වා දීමෙන් පසු ජනතාව තුළ පෝෂණය වූ ගති ලක්ෂණ අතර වූයේ,
1. බුද්ධිය හා පුද්ගල සබඳතා යි. 3. පවු තැවීම හා දැඩි සැප විඳීම යි.
2. භක්තිය හා විශ්වාසී බව යි. 4. අධි පරිභෝජනය හා මානය යි.

34. බුදු දහමෙහි උගන්වන සහජීවන ප්‍රතිපත්තියට ගරු කරන්නෝ,
1. අන්‍ය ආගම් ප්‍රතික්ෂේප කරති. 3. අන්‍ය ආගමික අයිතීන්ට ද ඉඩ දෙති.
2. සියලු ආගම් ඇදහීමට පෙළඹෙති. 4. නිර් ආගමික තත්ත්වයට පත්වෙති.

35. ථේරවාදී භික්ෂූන් වහන්සේලාගේ අදහසට අනුව බුද්ධ ශාසනයේ ආයුෂය ලෙස සළකනු ලැබුවේ,
1. විනය යි. 3. ධර්මය යි.
2. අභිධර්මය යි. 4. සූත්‍ර ධර්ම යි.

36. භාරතයේ පැවති සිව්වන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූයේ,
1. අජාසත්ත රජතුමා ය. 3. කාලාශෝක රජතුමා ය.
2. ධර්මාශෝක රජතුමා ය. 4. කණිෂ්ක රජතුමා ය.

37. සාමාන්‍ය ලෝකයාගේ අනුසෝතගාමී ක්‍රමය බැහැර කොට බුදු දහම ගරු කරන පටිසෝතගාමී පිළිවෙත අනුගමනය කිරීමෙන් ළඟාවිය හැක්කේ,
1. විරාගයෙන් රාගයට යි. 3. මෝහයෙන් අමෝහයට යි.
2. අද්වේශයෙන් ද්වේශයට යි. 4. නිරාමිසයෙන් සාමිසයට යි.

38. පංච බලි අතර **'අතිථිබලි'** ලෙස හඳුන්වන්නේ,
1. ඥාතීන්ට සැලකීම යි. 3. රජයට යුතුකම් ඉටුකිරීම යි.
2. ආගන්තුක සත්කාරය යි. 4. ආගමික කටයුතු සිදුකිරීම යි.

39. බුදුරජාණන් වහන්සේ විසින් **දුක්ඛ සමුදය ආර්ය සත්‍යය** තම ශ්‍රාවකයින්ට දේශනා කොට වදාළේ
1. උත්සාහයෙන් පුහුණු කිරීමට යි. 3. සම්පූර්ණයෙන් ප්‍රහීණ කිරීමට යි.
2. අත්දැකීමක් ලෙස පසක් කිරීමට යි. 4. මැනවින් වටහා ගැනීමට යි.

40. බෞද්ධයින් වන අප උතුම් වූ ප්‍රඥාව සම්පූර්ණ කිරීමෙන් නිවන් සම්පත් හිමිකර ගන්නා මගෙහි ආරම්භක දොරටුවට පිවිසි බව ස්ථිර වන්නේ,
1. දිනපතා පුද පූජා පැවැත්වීමෙනි. 3. අවබෝධයෙන් තෙරුවනෙහි පැහැදීමෙනි.
2. තමා වරදින් වැළකීමෙනි. 4. ගිහි ආගමික නායකයෙකු බවට පත් වීමෙනි.



අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය, 2018 දෙසැම්බර්**

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

| | |
|---|---|
| බුද්ධ ධර්මය i,ii | කාලය පැය තුනයි |

බුද්ධ ධර්මය ii

සැලකිය යුතුයි.

- **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

01. කෙටි පිළිතුරු සපයන්න

i. සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන පරිදි පැවිදි උතුමන්ගෙන් ගිහියන්ට ඉටුවිය යුතු යුතුකම්වලින් දෙකක් දක්වන්න.

ii. උපෝසථ අෂ්ටාංග සීලයට ඇතුළත් නොවන ආජීව අෂ්ටමක සීලයට පමණක් ඇතුළත් වන ශික්ෂාවන් දෙකක් ලියන්න

iii. බුදුරජාණන් වහන්සේගේ චාරිකා අතර නිබද්ධ චාරිකා යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද ?

iv. නිවන් ලැබීමට අමතර ව විදර්ශනා භාවනාවෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

v. පළමු ධර්ම සංගායනාවේ දී අංගුත්තර නිකාය හා සංයුක්ත නිකාය භාර වූ භානක පිරිස නම් කරන්න.

vi. බෙල්ලන්විල විහාරය හා බොරැල්ලේ ගෝතමී විහාරයේ ආරම්භක යුගයේ සිතුවම් අඳින ලද චිත්‍ර ශිල්පීන් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න.

vii. දඹදෙණිය සාහිත්‍ය යුගයේ දී රචිත මහා කාව්‍යයත්, එයට වස්තු විෂය කරගත් ජාතක කතාවත් නම් කරන්න.

viii. පාරමිතා ගුණ ධර්ම පුහුණු කරන්නෙකු විසින් අත්හැරිය යුතු කරුණු දෙකක් නම් කරන්න.

ix. "දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං....."යනාදී ගාථාවේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

x. මෙතෙක් හමු වී ඇති කලාත්මක ම බෝධිඝරය පිහිටි ස්ථානය හා එම ස්ථානය අයත් දිස්ත්‍රික්කය නම් කරන්න.

(ලකුණු 02x10 =20 යි )

02. i. සීලයේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ දේශනා කළ සීලයෙහි ආනිසංස තුනක් නම් කරන්න.

iii. **"සීලය පුද්ගලයෙකුගේ ලෞකික හා ලෝකෝත්තර ජීවිතය සැපවත් කරයි."** මේ පිළිබඳ ව අදහස් දක්වන්න.



අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාර ධර්ම ඒකකය

03. i. “නතං කම්මං කතං සාධු ..............”යන ගාථාව සම්පූර්ණ කොට ලියන්න.

ii. ඉහත (i)හි ඇතුළත් ගාථාවෙහි තේරුම ලියන්න.

iii. අර්ථවත් ජීවිතයක් ගතකිරීමෙහි ලා බුදුරජාණන් වහන්සේගේ මෙම දේශනාව කෙතෙක් දුරට හේතුවන්නේ දැ යි පැහැදිලි කරන්න.

04. i. දෙවන ධර්ම සංගීතියට බලපෑ ප්‍රධාන හේතුව සැකෙවින් දක්වන්න.

ii. දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, මුලසුන ගත් මහතෙරුන් වහන්සේ, අනුග්‍රාහකත්වය දක් වූ රජු නම් කරන්න.

iii. ථේරවාදී ධර්ම සංගායනා වර්තමාන සමාජ අසමගිය දුරුකරගැනීමෙහි ලා ඉවහල්වන ආකාරය පැහැදිළි කරන්න.

05. i. හේතුඵලවාදය තුළින් බැහැර කෙරෙන ආගමික පිළිගැනීම් දෙකක් නම් කරන්න.

ii. පටිච්චසමුප්පාදයෙහි **“අවිජ්ජා පච්චයා සංඛාරා”** යන්නෙහි අදහස කෙටියෙන් දක්වන්න.

iii. සමාජගත දුක ඇතිවන හා නැතිවන ආකාරය පැහැදිලි කිරීමට පටිච්චසමුප්පාද න්‍යාය උපයෝගී කරගත හැකි අයුරු පෙන්වා දෙන්න.

06. i. අනුරාධපුර මහමෙවුනා උයනේ වැඩසිටින සමාධි පිළිම වහන්සේ නිරූපණය කෙරෙන ආසනය හා මුද්‍රාව ලියා දක්වන්න.

ii. බුද්ධ ප්‍රතිමා වහන්සේ නිර්මාණය වීමට පෙර බුදුරජාණන් වහන්සේ වෙනුවට වන්දනයට ලක් වූ පූජනීය වස්තූන් අතරින් තුනක් නම් කරන්න.

iii. ආගමික පුරාවස්තු ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම අපගේ පරම යුතුකමකි. මේ ඇසුරින් වත්මන් සමාජයට ඔබ ලබා දෙන ආදර්ශය පෙන්වා දෙන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් <u>**දෙකකට**</u> පමණක් කෙටි සටහන් ලියන්න.

i. පටිමා සර.

ii. අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමි.

iii. ත්‍රි ලක්ෂණය.

iv. පුරුෂ දම්ම සාරථී ගුණය

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

අධ්‍යාපන අමාත්‍යාංශය

# අ බුද්ධ ධර්මය (පෙළ.සා) .ස.පො.පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2018

## පිළිතුරු පත්‍රය   කොටස 1

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|
| 01 | 4 | 21 | 2 |
| 02 | 1 | 22 | 1 |
| 03 | 1 | 23 | 2 |
| 04 | 2 | 24 | 4 |
| 05 | 1 | 25 | 2 |
| 06 | 4 | 26 | 1 |
| 07 | 3 | 27 | 4 |
| 08 | 3 | 28 | 2 |
| 09 | 2 | 29 | 2 |
| 10 | 3 | 30 | 4 |
| 11 | 4 | 31 | 1 |
| 12 | 1 | 32 | 3 |
| 13 | 1 | 33 | 1 |
| 14 | 4 | 34 | 4 |
| 15 | 1 | 35 | 1 |
| 16 | 3 | 36 | 3 |
| 17 | 1 | 37 | 2 |
| 18 | 3 | 38 | 3 |
| 19 | 1 | 39 | 4 |
| 20 | 4 | 40 | 2 |

## 2 කොටස

1. ( I ) පවින් වැළැක්වීම, යහපත් ක්‍රියාවල යෙදවීම, හොඳ හිතින් ම අනුකම්පා කිරීම, නොඇසූ දේ කියාදීම, ඇසූදේ වඩාත් පැහැදිලි කරදීම, සුගතියට මග පෙන්වීම.

( II ) කාමේසු මිච්ඡා චාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

පිසුනාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

පරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

සම්පප්ඵලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

( III ) විශේෂ පුද්ගලයකු හෝ පිරිසක් අරමුණු කොට පිහිට වීමට වැඩම කිරීම යි.

( IV ) අල්පේච්ඡ චාම් ජීවිතයක් ගත කිරීම, ලද දෙයින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය හැක්කෙකු වීම, කටයුතු බහුල නොවන අයෙකු වීම.

( v ) අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට, මහා කාශ්‍යප තෙරුන්ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට,

( v I) සෝමබන්දු විද්‍යාපති, ජෝර්ජ්කීට්.

( v II) කව්සිළුමිණ, කුස ජාතකය.

( vIII) තණ්හාව, මානය, මිථ්‍යා දෘෂ්ටිය

( IX ) යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා

( X ) කුරුණෑගල නිල්ලක්කම ගම

2. ( I ) චාරිත්‍ර (සිරිත්, සමාදාන)

වාරිත්‍ර (විරිත්, විරමණය)

(II) මහත් වූ භෝග සම්පත් හිමිකර ගැනීම,

කීර්තිය පැතිරීම.

ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකිවීම.

සිහිමුලා නොවී කළුරිය කිරීම.

මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.

(III) 10 ශ්‍රේණිය 8 පාඩම සහ 11ශ්‍රේණිය 7 පාඩම ඇසුරු කරමින් නිති පන්සිල් රැකීමෙන් ද ආජීව අෂ්ටමක සීලය, උපෝෂත අෂ්ඨාංග සීලය, ගිහි දස සීලය සුදුසුඅවස්ථාවන්හි සමාදන්ව ආරක්ෂා කිරීමෙන් ලඟාකරගත හැකි ලෞකික ලෝකෝත්තර දියුණව පැහැදිළි කොට ඇති ආකාරය තක්සේරුකොට ලකුණුලබා දෙන්න.

3. (I) නතං කම්මං කතං සාධූ් යං කත්වා අනුතප්පති

යස්ස අස්සු මුඛෝ රෝදං - විපාකං පටිසේවතී

(II) යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේ ද, යමක විපාකය කඳුළු පිරි මුහුණින් යුතු ව අඬමින් විඳින්නට සිදවේ ද එබඳු දේ නොකිරීම යහපත් ය.

(III) 11 ශ්‍රේණියේ 6 පාඩමේ බාලවග්ගයේ 8 ගාථාව හා එහි අන්තර්ගත තේරුම ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය. එහි දී අර්ථවත් ජීවිතයක් යනු තමාටත් අනුන්ටත් වැඩදායක වූවකි. එසේ නොවී දෙපිරිසටම අනර්ථකාරී ජීවිතයක් ගතකළහොත් එය මුළු ජීවිතකාලයටම පසුතැවිල්ලට ලක්වන්නක්වේ. එවන් අනර්ථකාරී ජීවිතගතකිරීමෙන් බැහැර ව ක්‍රියාකිරීම බුද්ධ දේශනාව බව විස්තර කරමින් පිළිතුර සකස් විය යුතු ය.

4. (I) වජ්ජිපුත්තක භික්ෂූන් මහන්සේලා විසින් කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කරගෙන එනු ලැබූ දස අකැප වස්තුව.

(II) පැවැත් වූ ස්ථානය - විශාලා මහනුවර වාළුකාරාමය

මූලිකත්වය් සබ්බකාමී මහ රහතන්වහන්සේ

අනුග්‍රාහකත්වය- කාළාශෝක රජු

(III) ආවේගශීලී නොවී ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීම, බුද්ධිමත් ව නියමිත කාලයට පිළිතුරු ලබාදීම යන කරුණු සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශයට ඇහුම් කන් දී මහා කාශ්‍යප හිමි ක්‍රියාකළ ආකාරය තුළින් පිළිබිඹුවන බව.

ගැටළු විසඳීමට බුද්ධිමතුන්ගේ සහාය ලබාගැනීම.

කාරක සභාක්‍රමය ක්‍රියාත්මක කිරීම. ( උබ්බාහිකාව)

නීති ගරුකව කටයුතු කිරීම යනා දී කරුණු සංගායනා තුන ඇසුරෙන් ම ගෙන පිළිතුර සකස්විය යුතු ය.

5. (I) ඊශ්වර නිර්මාණවාදය හෙවත් පුද්ගලයා සහිත ලෝකය දෙවි කෙනෙකුගේ නිර්මාණයක් ලෙස දැක්වීම.

සියල්ල පෙරකරන ලද කර්මයෙන් සිදුවන දැක්වීම. නියතිවාදය. ආත්මවාදය.

(II) චතුරාර්ය සත්‍යය නොදැනීම හේතු කරගෙන කුසල් අකුසල් රැස් කරයි.

(III) චක්කවත්ති සීහනාද සූත්‍රය මගින් දුප්පත්කම හේතු කරගෙන සමාජ ගැටළුව ඇතිවන ආකාරයත්, පාලකයා එයට නිසි විසඳුම් ලබාදීම තුළින් එම සමාජ ගැටළුව නිරාකරණය වෙන අයුරු දැක්වීම, සමාජය තුළ පවත්නා වූ ඩෙංගු මදුරු උවදුරු ඇතිවීමට හේතුත් ඒ නිසා ඇතිවන විවිධ ගැටළුත්, ඩෙංගු උවදුරු ඇතිවීමට හේතු නැති කිරීමෙන් විවිධ ගැටළු නිවාරණය වන ආකාරයත් විස්තර විය යුතු යි.

6. (I) වීරාසනය හා ධ්‍යාන මුද්‍රාව

(II) බෝධිය, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල. ධර්මචක්‍රය. හා ස්තූපය

(III) ඇතැම් පිරිස් ධන ලෝභයෙන් නිදන් වස්තු පැහැරගැනීම උදෙසා කරනු ලබන විනාසකාරී ක්‍රියා දැනගත් විගස ආරක්ෂක අංශ දැනුවත් කිරීම. පෞරාණික ස්ථාන නැරඹීමට ගිය පසු උපදෙස්වලට අනුගතව ක්‍රියා කිරීම. එම ස්ථාන දැක බලා ගැනීමට ගිය පසු පැරණි නිර්මාණ හෝ ගඩොල් බැම් මත ඇවිද නොයෑම, යනා දි වශයෙන් මෙයට අදාල පිළිතුරු (10 බුද්ධ ධර්මය පෙළපොත 20 වන පාඩමේ අවසාන ඡේදය තුළිනු ත් 11 පෙළ පොතේ 20 පාඩමේ අවසාන කොටසේ ත් ඇති කරුණු සැළකිල්ලට ගෙන) පිළිතුර සකස් විය යුතු ය.

7. (I) **පටිමාඝර** යනු පිළිම ගෙවල් ය. පිළිම නෙළීම ආරම්භක වකවානුවේ ඒ සඳහා ගෘහ විශේෂයක් නොපැවති අතර පසු කාලයේ ඒ සඳහා ගෘහයන් ඉදි විය. ඉපැරණි ප්‍රථිමාඝර වර්ග තුනකි **ගන්ධ කුටි, පාසාද හා ගෙඩිගේ** යනුවෙන් දැක්වෙනුයේ එම පිළිමගෙවල් ය. මෙම ප්‍රතිමාඝර වර්ග තුන පිළිබඳව 11 ශ්‍රේණියේ 18 පාඩමේ ඇතුලත් තොරතුරු ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය.

(II) අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහා නාහිමියන් පිළිබඳව 11 ශ්‍රේණියේ 5 වන පාඩමේ අන්තර්ගත කරුණු අතරින් උන්වහන්සේසේගේ ජීවන තොරතුරු, ශාසනික සේවාවන් හා ජාතික සේවාවන්, චරිතාදර්ශ පිළිබඳව කෙටියෙන් දක්වා තිබීම ප්‍රමාණවත් ය.

(III) 10 වන ශ්‍රේණියේ 13 පාඩමේ දැක්වෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විස්තර කෙරෙන ත්‍රිලක්ෂණය පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් අපේක්ෂා කෙරේ. බුදුරදුන්ගේ මෙම මූලික ඉගැන්වීම පුද්ගලයාගේ මෙලොව ජීවිතය සරුකර ගැනීමට හේතුවන අයුරු සැකෙවින් විස්තර විය යුතු ය.

(IV) බුදුරජාණන් වහන්සේගේ පුරිස ධම්මසාරතී ගුණය පිළිබඳ ව 11 ශ්‍රේණියේ 2 වන පාඩම ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය. එහි අන්තර් කරුණු නිදසුන් සහිතත ව සැකෙවින් විස්තරකර ඇත්නම් ප්‍රමාණවත් ය.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය, 2018 දෙසැම්බර්**

උපකාරක ප්‍රශ්න පත්‍රය

| බුද්ධ ධර්මය i,ii | කාලය පැය තුනයි |
|---|---|

## බුද්ධ ධර්මය ii

- පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1 කෙටි පිළිතුරු සපයන්න.

i. බුදු දහමෙහි දැක්වෙන අදැහැමි වෙළෙඳාම් ක්‍රමයක් වන **'කංස කූට'** යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

..................................................................

ii. **"භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායා ති භාවනා"**යන්නෙහි අදහස ලියන්න.

..................................................................

iii. ගර්භයේ හැඩය අනුව වෙනස්වන දාගැබ් වර්ග **දෙකක්** නම් කරන්න.

..................................................................

iv. වැලිවිට අසරණ සරණ සරණංකර මාහිමියන් විසින් රචනා කළ ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

..................................................................

v. **"අවෙච්චප්පසාදය"**යන්නෙහි තේරුම ලියන්න.

..................................................................

vi. මුවදෙව්දාවත සහ සසදාවත ලිවීමට පාදක වූ **ජාතක කථා දෙක** මොනවා ද ?

..................................................................

vii. වාහල්කඩ අතරින් පැරණි හා උසස් ම **වාහල්කඩ** දැකිය හැකි ස්ථානය නම් කරන්න.

..................................................................

viii. ''**ස්වාක්ඛාත**'' නැමැති දහම් ගුණයේ තේරුම ලියන්න.

..................................................................

ix. සීලයේ මූලික ප්‍රභේද **දෙක** ලියන්න.

..................................................................

x' පානදුරා වාදය ඇතුලු වාදවල තොරතුරු අසා ලංකාවට පැමිණි **ඇමරිකන් ජාතික මැතිතුමා** සහ **රුසියානු ජාතික මැතිණිය** නම් කරන්න.

..................................................................

2 i. බුදුරජාණන් වහන්සේ විසින් කාලාම සූත්‍රය දේශනා කරන ලද්දේ කාට ද?

..................................................................

ii' කාලාම සූත්‍රයට අනුව යමක් පිළිගැනීම සඳහා සුදුසු නොවන නිර්ණායක **තුනක්** ලියන්න.

..................................................................

iii' කාලාම සූත්‍රයේ පෙන්වා දෙන පරිදි යමක් පිළිගැනීමට යොදා ගත යුතු නිර්ණායක පුද්ගල පෞරුෂ සංවර්ධනය සඳහා යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

3 i. **"අත්තනාව කතං පාපං......"** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

ii' ඉහත (i) හි දැක් වූ ගාථාවේ සරල අදහස ලියන්න.

iii' ඉහත (i) හි දැක් වූ ගාථාවේ සඳහන් කරුණු පුද්ගල චරිත සංවර්ධනය විෂයෙහි යොදාගත හැකි ආකාරය පහදන්න.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

4 i. යහපත් රාජ්‍ය පාලනයකට උපකාරී වන දසරාජ ධර්ම අතරින් දෙකක් ලියන්න.

ii ' ඉහත (i) හි දැක් වූ කරුණු අතරින් එකක් කෙටියෙන් දක්වන්න.

iii ' 'රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළින් සාරධර්ම සපිරි යහපත් සමාජයක් ගොඩනැගිය හැකි ය'. මෙම අදහස තහවුරු කරන්න.

අධ්‍යාපන අමාත්‍යාංශය- ආගමික හා සාරධර්ම ඒකකය

5 i. ත්‍රිලක්ෂණය නම් කරන්න.

ii' ඉහත (i)හි දැක් වූ ලක්ෂණ කෙටියෙන් දක්වන්න.

iii' දෛනික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා තිලකුණු උපකාරී වන ආකාරය නිදසුන් සහිත ව විමසන්න.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

6 i. සීහලට්ඨකථා හෙවත් හෙළ අටුවා යනු මොනවා ද?

ii ' **ධර්ම ප්‍රදිපිකාව , පූජාවලිය හා සද්ධර්මරත්නාවලිය** යන කෘති රචනා කළ කතුවරුන් නම් කරන්න.

**ධර්ම ප්‍රදිපිකාව** ...................................

**පූජාවලිය** ...................................

**සද්ධර්මරත්නාවලිය** ...................................

iii ' බුදුසමයෙන් පෝෂණය වූ සිංහල සාහිත්‍යය සදාචාරවත් සමාජයක් ගොඩනැගීමට ඉවහල් වූ අයුරු පහදන්න.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

7 පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i දුටු ගැමුණු රජතුමා

ii විදර්ශනා භාවනාව

iii මහින්දාගමනය

iv මහනුවර යුගයේ චිත්‍ර කලාව



අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය

අධ්‍යාපන අමාත්‍යාංශය- ආගමික හා සාර ධර්ම ඒකකය

.............................................................................................................................................

වැඩි දුරටත්

1. i. බෞද්ධ භාවනාවේ ප්‍රධාන කොටස් දෙක මොනවා ද?
   ii. භාවනාවට කමටහන් ලබා දෙනුයේ පුද්ගල චරිත අනුව ය. එම චරිත නම් කරන්න.
   iii. බෞද්ධ භාවනාව ශිෂ්‍ය ජීවිතයේ අරමුණු ජයගැනීමට යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

2. i. වැඩසිටින ඉරියව්ව අනුව බුදු පිළිම වර්ග තුනකි. එයින් දෙකක් නම් කරන්න.
   ii. ඉපැරණි පටිමා සර වර්ග මොනවා ද?
   iii. බුදු පිළිමයේ ආරම්භය හා විකාශනය සිදු වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.

3. i. බෝසතාණන් වහන්සේ **ප්‍රඥා පාරමිතාව හා නෙක්ඛම්ම පාරමිතාව** පිරූ බවට උදාහරණ දැක්විය හැකි ජාතක කතා දෙකක් නම් කරන්න.
   ii. වීර්යයෙහි පියවර තුන කවරේ ද?
   iii. යහපත් ආකල්ප සමාජගත කරන පිළිවෙත් සමූහයක් වශයෙන් දස පාරමිතාවල අගය පැහැදිලි කරන්න.

4. i. බුදුරජාණන් වහන්සේ විශේෂ පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් අරහයා පිහිටවීමට වැඩමකළ චාරිකා ක්‍රමය හඳුන්වන නම කුමක් ද?
   ii. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද කාන්තාවන් තිදෙනෙකු නම් කරන්න.
   iii. 'තාදි ගුණය චරිතායනය කරගැනීම තුළින් යහපත් ජීවිතයක් ගතකළ හැකි ය'. මෙම අදහස තහවුරු කරන්න.

අධ්‍යාපන අමාත්‍යාංශය- ආගමික හා සාරධර්ම ඒකකය

අධ්‍යාපන අමාත්‍යාංශය

අ.පො.ස. (සා.පෙළ) බුද්ධ ධර්මය උපකාරක සම්මන්ත්‍රණය 2018

පිළිතුරු පත්‍රය   1 කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | | 11 | 3 | | 21 | 1 | | 31 | 3 | |
| 2 | 3 | | 12 | 2 | | 22 | 4 | | 32 | 4 | |
| 3 | 2 | | 13 | 3 | | 23 | 2 | | 33 | 1 | |
| 4 | 4 | | 14 | 1 | | 24 | 4 | | 34 | 3 | |
| 5 | 1 | | 15 | 2 | | 25 | 3 | | 35 | 1 | |
| 6 | 3 | | 16 | 3 | | 26 | 2 | | 36 | 4 | |
| 7 | 3 | | 17 | 4 | | 27 | 1 | | 37 | 3 | |
| 8 | 2 | | 18 | 2 | | 28 | 2 | | 38 | 2 | |
| 9 | 1 | | 19 | 1 | | 29 | 2 | | 39 | 3 | |
| 10 | 2 | | 20 | 2 | | 30 | 1 | | 40 | 3 | |

පිළිතුරු පත්‍රය   11 කොටස

| | | |
|---|---|---|
| 01. | 1. | බාල දෙය අගය කර විකිණීම |
| | 2. | කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය  භාවනාව යි. |
| | 3. | බුබ්බුලාකාර, ධාන්‍යාකාර, ඝණ්ඨාකාර, ගඨාකාර,ආමලාකාර, පද්මාකාර |
| | 4. | මුනිගුණාලංකාරය,  සාරාර්ථසංග්‍රහය,  රතනත්‍රය ගාථා ප්‍රණාම සන්නය, සතර බණවර සන්නය |
| | 5. | ත්‍රිවිධ රත්නය කෙරෙහි කරුණු දැන ඇතිකර ගන්නා පැහැදීම |
| | 6. | මුවදෙව්දාවත  -  මඛාදේව ජාතකය  සසදාවත  -  සස ජාතකය |
| | 7. | මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි |
| | 8. | මුල, මැද, අග  මනා ව දේශනා කර ඇති බැවින් |
| | 9. | චාරිත්‍ර - වාරිත්‍ර / සිරිත් - විරිත් |
| | 10. | ඇමරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා<br>රුසියානු ජාතික බ්ලැවැට්ස්කි මැතිනිය |
| 2. | 1. | කේසපුත්තයෙහි  කාලාම වැසියන්ට |
| | 2. | 1. ආරංචි මාත්‍රයෙන්<br>2. පරම්පරාවෙන් පැවත එන නිසා<br>3. මෙය මෙසේ වී යැ යි කටකථා මගින් |

| | | |
|---|---|---|
| | | 4. අපගේ ඉගැන්වීම සමග ගැළපේ යැ යි<br>5. මෙය තර්කානුකූල යැයි<br>6. න්‍යායානුකූල යැ යි<br>7. මතු පිට ස්වරූපයට අනුව<br>8. තම දෘෂ්ටිය අනුව සැසඳේ යැ යි<br>9. සුදුසු බව පෙනී ය යි<br>10. මේ ශ්‍රමණයා අපගේ යි ගුරුවරයා යැ ය |
| | 3. | යමක් පිළිගැනීමට යොදා ගත යුතු නිර්ණායක වන<br>1. කුසල් ද අකුසල් ද<br>2 . නිරවද්‍ය ද සාවද්‍ය ද<br>3. නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ද වසන ලද්දේ ද<br>4. පිරිපුන් කොට සමාදන් කොට ගත් තැනැත්තාගේ අහිත පිණිස පවතී ද හිතසුව පනත පවතීද<br>යන නිර්ණායක පදනම් කොටගෙන පිළිතුර ලිවිය යුතු ය.<br>• මෙම නිර්ණායක පුද්ගලයාගේ කතාබහ ක්‍රියා අදහස් කෙරෙහි බලපාන සමබර පෞරුෂයක් ගොඩනැගෙන ආකාරය සාකච්ඡා කළ යුතු ය. |
| 3. | 1. | අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති<br>අත්තනා අකතං පාපං<br>අත්තනා ව විසුජ්ඣති<br>සුද්ධි අසුද්ධි පච්චත්තං<br>නාඤ්ඤෝ මඤ්ඤෝ විසෝධයේ |
| | 2. | යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙළසෙන්නේ ය. යමෙකු පව් නොකළොත් එයින් ම ඔහු පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහි ම ය. එක් අයකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය. |
| | 3. | * පුද්ගලයෙකු දුක් කම්කටොළු සහිත ජීවිතයක් ගෙවන්නේ ද සැපවත් ජීවිතයක් ගෙවන්නේ ද තමා කළ පුණ්‍ය කර්ම හෝ පාප කර්ම හෝ මත ය.<br>* පුද්ගලයාගේ චරිතය ගොඩනඟා ගත යුත්තේ ඔහු විසින්ම ය.<br>* යහපත් ගුණධර්ම වලින් හෙබි පුද්ගලයෙකු සමාජයේ කැපී පෙනේ. එය එම පුද්ගලයා විසින් ම ගොඩනඟා ගත්තෙකි.<br>* එමෙන් ම අයහපත් පුද්ගලයා ද එකී චරිත ලක්ෂණ තමා විසින් ම ගොඩනඟා ගත්තෙකි.<br>මේ පිළිබඳ අදහස් දක්වා ඇත්නම් ලකුණු පිරිනමන්න. |
| 4. | 1./ 2 | 1. දානය - රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම<br>2. සීලය - කායික හා වාචසික සංවරයෙන් යුක්ත වීම<br>3. පරිත්‍යාගය - රට වැසියාගේ යහපත සඳහා තම කාලය ශ්‍රමය ධනය සුවපහසුව කැප කිරීම<br>4. ඍජු බව - බාධක හා බලපෑම් වලට යොමු නොවී සතර අගතියෙන් තොර ව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවංකව කටයුතු කිරීම<br>5 . මෘදු බව - හදවතේ ඇති මොළොක් බව හෙවත් තෙත් ගතිය යි |

| | | |
|---|---|---|
| | | 6. තපස - පසිඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියා කිරීම තපස යි.<br>7. අක්‍රෝධය - වෛරය සහගත බවින් මිදීම<br>8. අවිහිංසාව - කායික හා මානසික ව හිංසාවෙන් මිදීම<br>9. ඉවසීම - ක්ෂණික තීරණ වලට එළැඹ නොවීඉවසිලිවන්ත ව ක්‍රියා කිරී ම.<br>10. අවිරෝධතා - මධ්‍යස්ථව හා ගැටුමින් තොර ව කටයුතු කිරීම |
| | 3. | දස රාජ ධර්ම<br>සිවුබඹ විහරණ<br>පංචසීල ප්‍රතිපදාව<br>සතර අගතිය<br>දස සක්විති වත්<br>සතර සංග්‍රහ වස්තු ආදිය උපයෝගී කොට ඒ ඇසුරින් පිළිතුරු ලියා තිබිය යුතුය. |
| 5. | 1. | අනිත්‍ය, දුක්ඛ, අනාත්ම |
| | 2. | • අනිත්‍ය - වෙනස්වන සුළු බව (පංචස්කන්ධය ම වෙනස්වීමට භාජනය වේ)<br>• දුක්ඛ - ලෝකයේ සියල්ල වෙනස් වන බැවින් දුක් සහිත වේ. ජාති ජරා ව්‍යාධි මරණ ආදි සියල්ල දුක් සහිත වේ.<br>• අනාත්ම - සියල්ල අනිත්‍ය හා දුක් සහිත බැවින් මම ය මගේ යැයි ගත හැකි කිසිවක් නැත. |
| | 3. | අනිත්‍ය දේ අනිත්‍ය ලෙසත් දුක් සහිත දේ දුක් ලෙසත් අනාත්ම දේ අනාත්ම ලෙසත් හඳුනා ගැනීමට බුදු දහම මග පෙන්වයි.<br>* එවිට පුද්ගලයා අසීමිත ආශාවන්ගෙන් තොර වේ.<br>* අල්පේච්ඡ බව අගය කරමින් පුද්ගල චරිතය ගොඩනැගේ.<br>* පහසුවෙන් පෝෂණය කළ හැකි ලද දෙයින් සතුටට පත්වේ.<br>* තිලකුණු දන්නා තැනැත්තා අකම්පිත ය අටලෝදහමින් කම්පා නොවේ.<br>* මැදහත් උත්සාහවන්ත චරිතයක් තිලකුණු හඳුනාගැනීමෙන් ගොඩනැගේ. |
| 6. | 1. | මෙරට පැරණි ම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති |
| | 2. | ධර්ම ප්‍රදීපිකාව - ගුරුළුගෝමී පඬිතුමා<br>පූජාවලිය - මයුරපාද පරිවේනාධිපති බුද්ධපුත්‍ර හිමි<br>සද්ධර්ම රත්නාවලිය - ධර්මසේන හිමි |
| | 3. | *මෙරට සිංහල සාහිත්‍ය කෘති බුදුදහමින් පෝෂණය වී ඇත.<br>"පෙදෙන් බුදු සිරිත-බසින් වත් සිරිත් ඈ"<br>*එබැවින් සාධු සම්මත සමාජයක් ගොඩනැගීමට වන පිටිවහල අපමණ ය.<br>*ජාතක කතා පොත සත්ත්ව චරිත යොදා ගනිමින් ජීවිතාදර්ශ සපයයි.<br>*උත්සාහය, කළගුණදම්, මව්පිය ගුණ, එකමුතු බව ආදී යහපත් සමාජයක් ගොඩනැගීමට දායක වන කාරණා ඒවායෙහි අසීමිත ය. |

| | | |
|---|---|---|
| | | *සද්ධර්ම රත්නාවලිය ගැමිවහර උපයෝගී කොටගෙන ජීවිතාදර්ශ සපයයි මෙහි සෑම කතාවකම අරමුණ දක්වා ඇත<br>*දහම් සරණ සහ සරණ බුත්සරණ අමාවතුර ආදී සෑම ග්‍රන්ථයකින් ම පාහේ යහපත් සමාජයකට දායක වන උපදෙස් ගුණධර්ම අන්තර්ගත වේ. |
| 7 | 1. | 10 ශ්‍රේණිය 06 පාඩම 37-39 පිටු |
| | 2. | 10 ශ්‍රේණිය 05 පාඩම 28- 32 පිටු |
| | 3. | 11 ශ්‍රේණිය 17 පාඩම 118 -122 පිටු |
| | 4. | 11 ශ්‍රේණිය 18 පාඩම 132-133 පිටු |

7). 1දුටුගැමුණු රජු

#. මූලික තොරතුරු

*පියා කාවන්තිස්ස රජු වන අතර මව විහාර මහා දේවියයි එකම සොයුරා සද්ධාතිස්ස වේ. මෙතුමා රුහුණු රජ පෙළපතට අයත් ය

*''මාගේ මේ ව්‍යායාමය බුද්ධශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසිකලෙකත් රජ සැප පිණිස නොවන්නේය''යන පාඨය පෙරදැරිව මෙතුමා ක්‍රියා කළේය

*එවකට අනුරාධපුරය පාලනය කළ එළාර නම් රජුට විරුද්ධව සටන් කළ බව මහාවංශයේ සඳහන් වේ.

මෙතුමා කාලයක් තම රත් තම පියරජතුමා සමඟඅමනාපව කොත්මලේ ප්‍රදේශයේ විසූ බව සඳහන් වේ

*පිය රජුගෙන් පසුව රුහුණේ පාලකයා වූ දුටුගැමුණු කුමරු තම මවගේ භික්ෂූන් වහන්සේගේ ත්ආශිර්වාද ලබා සේනා සන්නද්ධව අනුරාධපුරය ආක්‍රමණය කොට vijithapuraනම් ස්ථානයේ දී තීරණාත්මක සටනකින් ජය ලබා ත්‍රිසිංහලය එක්සේසත් කළේය

# ශාසනික සේවා

*මිරිසවැටියරුවන්වැලිසෑයලෝවා මහා ප්‍රාසාදය නිර්මාණ වේ.

*මහා විහාරය ප්‍රතිසංස්කරණය කළ බවද සඳහන් වේ

*මෙතුමාගේ රාජ්‍ය කාලය තුළ වෙසක් උත්සව විසි හතරක් පැවැත්වූ බව මහාවංශයේසඳහන් වේ

*ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල සේවාවක් ආරම්භ කිරීම ද දුටුගැමුණු රජතුමාගේ මෙහෙවරකි

*තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි සටහන් කරගැනීම මෙතුමාගේ චරිතයෙහි සුවිශේෂී ලක්ෂණයකි

*පින් පොතට සවන් දෙමින් රුවන්වැලිසෑය දෙස බලා කාලක්‍රියා කළ බව සඳහන් වේ

2.විදර්ශනා භාවනාව

*පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීම විපස්සනාවයි

*ප්‍රඥා භාවනාවතිලකුනු භාවනාව වශයෙන් ද හැඳින්වේ

*මේ තුළින් ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ වේ

*''visesenaපස්සතීති විපස්සනා''යනුවෙන් එය දක්වා ඇත.

ආනිසංස

*ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ වීම

*ඊර්ෂ්‍යා ක්‍රෝධ ආදියෙහි ඵල රහිත බව අවබෝධ වී ඉන් මිදීම

*දූෂිත සිතිවිලි පාලනය වී ඉවසීම හා බුද්ධිමත්ව කටයුතු කිරීම වැනි ගුණාංග ජීවිතයට එක් වේ

*අටලෝ දහමින් කම්පා නොවීමටහුරුවීම

3 .. මහනුවර යුගයේ චිත්‍ර

*සිතුවම් දැකිය හැකි ස්ථාන-. දෙගල්දොරුව විහාරය මැදවල විහාරය රන්ගිරි දඹුලු විහාරය රිදී විහාරය බඹරගල විහාරය කැලණි පැරණි විහාර මන්දිරය

*චිත්‍ර ඇඳි චිත්‍ර ශිල්පීන්-. දේවේන්ද්‍ර මූලාචාරියාහිරියාලනයිදේදෙවරගම්පල සිල්වත් තැන

*විශේෂ ලක්ෂණ-1. පළමුවෙන් රූපවල බාහිර රේඛාව ඇඳ දෙවනුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීම

2. රතු සුදු කළු වර්ණ බහුලව භාවිත කිරීම

3. සුදු පැහැති සිතුවම් රතු පසුබිමේ දක්නට ලැබීම

4.අඛණ්ඩ කථන ක්‍රමය දක්නට ලැබේ

5 සිතුවම් තාත්වික නොවේ

6 පර්යාවලෝකනයදක්නට නැත පරිමාණ පරිමාණුකූල නොවේ

7 සිතුවම් බුද්ධිගෝචර නොවන අතර ඒවා දෘශ්‍ය ගෝචර වේ

4. මහින්දාගමනය

11 ශ්‍රේණිය17 පාඩම ඇසුරින්